# වලසාගේ අපූරු ඔවදන



දවසක් යහළුවෝ දෙදෙනෙක් කැලයක් මැදින් ගමනක් යද්දී වලසකු සම්බ වුණා.



ඉතින් යහළුවෝ දෙදෙනා ඉතාම  බිය වුණා.

ඒත් ඉන් එක් යහළුවෙක් අනෙත් කෙනා ගැන  නොසිතා තමාගේ
දිවි ගලවා  ගන්නේ කෙසේදැයි ආත්මාර්ථකාමී ලෙස සිතා
අසල දුටු ගහකට වහ වහා නැංගා.අනේ අසරණ වූ අනෙත් යාළුවා
ට කරන්න කිසිවක් මතක් වූයේ නැහැ.

අවසානයේ ඔහු මළාක් මෙන් බිම වැතිරී නිසලව සිටියා.



වලහා කෙමෙන් කෙමෙන් බිම වැතිරී  සිටි කෙනාට ළංවී

ඉවකොට  මළ මිනිසකු යැයි සිතා ඉවත ගියා.

වලසා ඇතට ගිය පසු ගසඋඩ සිටි යහළුවා බිමට බැස

මෙසේ අනෙකාගෙන් ඇසූවා."යාළුවේ, වලහා නුඹට

යමක් කොඳුරනවා මා දුටුවා ,



අනේ මාත් ආසයි දැනගන්න"විපතේදී තමා අසල

නොරැදෙන ඔබ වැනි මිතුරන් සමඟ යාළු වන්නට

එපායැයි වලහා මට රහසින් කියා ගියා.